# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2244/5 – 2021 සැප්තැම්බර් මස 06 වැනි සඳුදා – 2021.09.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2021 අංක 172 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4/3/18/2020/WS/177.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: DS-WD/LND/05/04/26.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්*, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2021 අගෝස්තු මස 06 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.** – ප්‍රාදේශීය ලේකම්, වැලිවිටිය, දිවිතුර.

2. **ඉඩමේ විස්තරය.**– දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැලිවිටිය, දිවිතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 192A, ගලහේන්කන්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අම්පෙගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියල කරන ලද අංක GA/WDT/2020/731 හා 2020.12.21 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

**01. කැබලි අක්ෂර 'A' – ගිල්ක්‍රොෆ්ට් වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0878ක් පමණ**

උතුරට: කේ. ඩී. ප්‍රභාත් සහ ටී. එච්. දයාවතී හිමිකම් කියන ගිල්ක්‍රොෆ්ට් වත්ත; නැගෙනහිරට: ටී. එච්. දයාවතී සහ යූ. ඩී. තිලකා මාලනී හිමිකම් කියන ගිල්ක්‍රොෆ්ට් වත්ත; දකුණට: ටී. එච්. දයාවතී, යූ. ඩී. තිලකා මාලනී හිමිකම් කියන ගිල්ක්‍රොෆ්ට් වත්ත සහ මාර්ගය; බටහිරට: මාර්ගය.


1A – G 34549 – 35 (2021/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2021 අංක 165 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/8/2016/HA/89.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: ATU/LND/04/DO41.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්*, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2021 අගෝස්තු මස 06 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි. –** ප්‍රාදේශීය ලේකම්, අතුරලිය.

2. **ඉඩමේ විස්තරය.–** දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, අතුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 306A, තලහගම බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, තලහගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අවසාන ගම් පිඹුරු අංක 86 අතිරේක අංක 37 පත්‍ර අංක 38 හා 2019.05.06 දිනැති අවසාන ගම් පිඹුරේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 807 – පරණපන්සලවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0181**

උතුරට, නැගෙනහිරට, දකුණට සහ බටහිරට: කැබලි අංක 103.